මාධ්‍ය ආචාර ධර්ම වලට අනුව, යම් පුද්ගලයෙකුගේ වාර්ගිකත්වය හෝ ආගමිකත්වය පුවතකට ඇතුළත් විය යුත්තේ, එය එම පුවතට සෘජුවම අදාළ වේ නම් පමණි.

එම පසුතලය යටතේ, දිනමිණ (දෙසැම්බර් 09, 2022) දින ගව සොරකමකට අදාළ කැබ් රියක් පොලිස් නිලධාරීන් යට කරමින් පලා ගිය බවට කියවෙන සිදුවීමක දී සිවු දෙනෙකු අත්අඩංගුවට ගැනීමේ පුවත වාර්තා කර ඇති ආකාරය සලකා බැලිය හැක. මෙම පුවත් අන්තර්ගතය තුළ, අත්අඩංගුවට පත් දෙදෙනෙකු "මුස්ලිම් ජාතිකයින්" බව ද සඳහන් කර ඇත.

ඔබ සිතන ලෙසට,

1) අත්අඩංගුවට පත් සිවුදෙනෙකුගෙන් දෙදෙනෙකුගේ පමණක් වාර්ගිකත්වය "මුස්ලිම්" වීම පුවතට අදාළ වන්නේ කෙසේ ද? සිදුවීමට සම්බන්ධ අනෙක් දෙදෙනාගේ වාර්ගිකත්වයන් සඳහන් කර නොමැත්තේ මන්ද?

2) මෙසේ එක් වාර්ගිකත්වයක් පමණක් සෘණාත්මකව ඉස්මතු කොට දැක්වීම ඔස්සේ, එම වාර්ගිකත්වයට අයත් පුද්ගලයින් සම්බන්ධයෙන් පොදුවේ අයහපත් අදහසක් සමාජගත නොවන්නේ ද?

3) එසේ නම්, මෙම පුවත් වාර්තාකරණය මාධ්‍ය ආචාර ධර්මයන් කඩ කිරීමක් නොවන්නේ ද?

අදාළ නොවන තැන වාර්ගිකත්වය ඉස්මතු නොකරමු!

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම් ඔබ දකිනා මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් මෙම Google පෝරමය (https://forms.gle/u5a5n5dJPDerh3Le7) පිරවීම මගින් අපිට එවන්න. නැතිනම් එම මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් අපගේ සමාජ මාධ්‍ය පර්යන්තයන් හරහා අප වෙත එවන්න.